## ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017/2018

---

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි (“සමාගම”) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා මධ්‍යම පරිමාණයේ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ කුඩා මධ්‍යම පරිමාණයේ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

-----------------------------

මාගේ මතය තත්වාගණනය නොකෙරෙන අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මා විසින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි සඳහන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය කෙරෙහි අවධානය යොමු කෙරේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

-------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

කෙසේ වුවද, 2018 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වී තිබුණු අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය අනුව සමාගම විශාල ප්‍රාග්ධන ඌනතාවයකට මුහුණ දී සිටින බව සැලකිල්ලට ගත යුතු වේ. මෙම තත්ත්වය අවම කිරීම සඳහා, සමාගම විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 30 හි පැහැදිලි කෙරේ.
ප්‍රදානවලින් ආදායම් ලෙස හඳුනාගත් රු.138,709,961ක් මූල්‍ය ප්‍රකාශනවල වෙනම නොදක්වා වියදම්වලට හිලව් කර තිබුණි.

### 2.2 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 මාර්තු 31 දිනට හානිකරණයට පෙර පැවති රු.167,463,995 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් ඉන්දියානු සමාගම් දෙකකින් ලැබිය යුතු එකතුව රු.147,261,000 ක්වූ ශේෂ වර්ෂ හතරකට වැඩි කාලයක සිට ගෙවීම් පැහැර හැර තිබුණි. කෙසේ වුවද, එම ශේෂ 2018 සැප්තැම්බර් මාසය අවසන් වන විටද සමාගම විසින් අයකර ගෙන නොතිබුණි.

(ආ) යාපනය විශ්වවිද්‍යාලයේ නම් කරන ලද උපාධි අපේක්ෂකයෙකු විසින් සිදුකරන ලද පර්යේෂණයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.2,286,129 ක මුදලක් වැය කර තිබුණු අතර මේ සඳහා 2015 අගෝස්තු 10 දින යාපනය විශ්වවිද්‍යාලයෙන් ලැබී තිබුණේ රු.1,852,700 ක මුදලක් පමණි. කෙසේ වුවද, ඒ සඳහා ගෙවන ලද වැඩිපුර මුදල වූ රු.433,429 ක් 2018 සැප්තැම්බර් මාසය අවසානය වන තෙක් විශ්වවිද්‍යාලයෙන් අයකර ගෙන නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 9.2 (ඉ) වගන්තිය | සමාගමේ සංවිධාන සටහන සහ කාර්ය මණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරය යටතේ පවතින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 9.3.1 (i) වගන්තිය | සමාගමේ බඳවාගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය සඳහා අදාළ අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය යටතේ පවතින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව මත අනුමැතිය ලබා දී නොතිබුණි |

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.145,272,784 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර අලාභය රු.131,961,978 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් රු.13,310,806 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් පර්යේෂණවලින් ලැබුණු ආදායම රු.31,236,324 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් පෞද්ගලික සමාගම් තුනක් සමඟ පර්යේෂණ ගිවිසුම් හතරකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම පර්යේෂණවලින් උපයාගත් මුළු ආදායම සහ එම පර්යේෂණ සඳහා දරන ලද මුළු පිරිවැය පිළිවෙලින් රු. 19,641,861 සහ රු.29,259,689 ක් වීමෙන් එම පර්යේෂණවලින් රු.9,617,828 ක අලාභයක් දැක්විණි.

(ආ) සමාගම විසින් විභව්‍ය සේවාලාභීන් සමඟ පර්යේෂණ ව්‍යාපෘතිවලට එළඹීමේ අරමුණින් 2016 සහ 2017 වර්ෂවලදී "සේවාලාභින් පාදක කර ගත් ව්‍යාපෘති පිළිබඳ පූර්ව වැඩ" යටතේ පර්යේෂණ ව්‍යාපෘති 12 ක් ආරම්භ කර තිබුණු අතර එම පර්යේෂණ ව්‍යාපෘති සඳහා 2017 දෙසැම්බර් 31 දිනට දරන ලද පිරිවැය රු.4,769,944 ක් විය. කෙසේ වුවද, එක් ව්‍යාපෘතියක් පමණක් අඛණ්ඩව පවත්වාගෙන යන බව හඳුනාගෙන තිබුණ අතර ඉතිරි ව්‍යාපෘති 11 සඳහා විභව්‍ය සේවාලාභීන් සොයා ගැනීමට 2018 සැප්තැම්බර් අවසානය දක්වා සමාගම අසමත් වී තිබුණි. එම ව්‍යාපෘති සඳහා දරන ලද පිරිවැය රු.4,327,630 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/23 දරන ගැසට් නිවේදනයට අනුව, උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස හඳුනාගෙන තිබුණි.

කෙසේ වුවද, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි පූර්ණ සහතිකවීම මත ශ්‍රී ලංකාව තුළ නැනෝ සහ/ හෝ උසස් තාක්ෂණය පිළිබඳ උපාධි පිරිනැමීම සඳහා 2017 සැප්තැම්බර් 19 දින SLINTEC ඇකඩමි (ඇපයෙන් සීමිත) නමින් වෙනමම ආයතනයක් සංස්ථාපනය කර තිබුණි.

එසේ වුවද, ශ්‍රී ලංකාව තුළ නැනෝ සහ/ හෝ උසස් තාක්ෂණය පිළිබඳ උපාධි පිරිනැමීම සඳහා SLINTEC ඇකඩමි (ඇපයෙන් සීමිත ) සමාගම වෙත අනුමැතිය ලබා දුන් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාගමේ 2017/2018 වර්ෂ සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, නිශ්ක්‍රීය වත්කම්වල පිරිවැය රු.10,074,179 ක් විය. කෙසේ වුවද, 2018 අගෝස්තු අවසානය වන විටද, එම වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික ප්‍රවාහන සමාගමක් වෙත රු.1,800,000 ක මුදලක් ගෙවා තිබුණද, ලබාගත් සේවයට අදාළව ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඈ) පෞද්ගලික සමාගමක් සමඟ ආරම්භ කිරීමට නියමිතව තිබුණු ව්‍යාපෘතියක් සඳහා අස්ථිත්වය විසින් 2016 ඔක්තෝබර් 31 දින රු.416,747 ක් වටිනා තීන්ත මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය ආරම්භ කර හෝ සමාගමෙන් ගෙවීම් අයකරගෙන හෝ නොතිබුණු අතර එම තීන්ත සැලකිය යුතු කාලයක් උපයෝජනයකින් තොරව සමාගම තුළ පැවතුණි.

(ඉ) SLINTEC ඇකඩමි විසින් ඉටු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සඳහා සමාගම විසින් එම ඇකඩමිය වෙත රු.1,715,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ඇකඩමිය විසින් සිදු කරන ලද පර්යේෂණ හා ඇකඩමියේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු ගෙවීම් සම්බන්ධයෙන් ගිවිසුම් හෝ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) වාහනයක් කුළියට ගැනීම සඳහා එළඹ තිබූ ගිවිසුම 2018 ජූලි 02 දින කල් ඉකුත් වුවද, 2018 අගෝස්තු 31 වන විටද, ගිවිසුම අලුත් කිරීමට හෝ දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2017/2018 වර්ෂයේ මිලදීගත් රු.3,574,063 ක් වූ මෝටර් රථයක් සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා වූ ප්‍රාග්ධන දීමනාවල වැරදි බදු ප්‍රතිශතය සඳහා වූ අයදුම්පත හේතුවෙන් විලම්බිත බදු වගකීම රු.911,827 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 4.3 නිශ්ක්‍රීය වත්කම්

විද්‍යාගාර දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් නොකළද, රු.92,083,892 ක් වටිනා විද්‍යාගාර උපකරණ සහ ලිබඩු අයිතමයන් 32ක් 2017 සහ 2018 වර්ෂවලදී මිල දී ගෙන තිබුණි. කෙසේ වුවද, එම වත්කම් 2018 අගෝස්තු අවසන් වන තෙක්ම උපයෝජනය කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම

සෑම රාජ්‍ය ආයතනයක්ම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ " 2030 න්‍යාය පත්‍රයට" අනුකූලව කටයුතු කළ යුතු අතර ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් ඉටු කරගැනීම පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදන කළමනාකරණය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 4.2.1 (ඇ) ප්‍රකාරව, එක් එක් ප්‍රසම්පාදනයේ පියවර දක්වමින් කාල සැලැස්ම සහිත සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වෙළඳ සහ අනෙකුත් ලැබීම් | දීර්ඝකාලීනව හිඟහිටි ශේෂ අයකරගෙන නොතිබුණි. |
| (ආ) | පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය | අවදානම අවම කිරීම සඳහා වන විධිවිධාන පර්යේෂණ ගිවිසුම්වල ඇතුලත් වී නොතිබුණි. |
| (ඇ) | ඉන්වොයිස් කිරීම | විධිමත් පාලනයක් ක්‍රියාත්මක නොවීම |
| (ඈ) | අත්තිකාරම් | විධිමත් ක්‍රියා පරිපාටියෙන් බැහැරව අත්තිකාරම් ලබාදීම |
| (ඉ) | කොන්ත්‍රාත් සේවා | කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමේ ප්‍රමාදයන් |